Srilanka

Labour Market Regulatory Authority

# ..ශ්‍රම වෙළඳපල පාලන අධිකාරිය
# විදේශීය සේවක මාර්ගෝපදේශය , සංස්කරණය 4.0

## L M R A මගින් සේවය කිරීමට අපේක්ෂා කරන විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් සැපයෙන සේවාවන්

- සේවා වීසා නිකුත්කිරීම සහ සේවා වීසා නැවත අළුත්කිරීම.
- මාරු කිරීම.
- සේවකයා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් සඳහා ඇතුළුවීමේ වීසා (Entry visa) ලබාදීම සහ පදිංචි බලපත්‍ර සහ බහු ආංශික ඇතුළුවීමේ වීසා සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාල ආයතන සමග සම්බන්ධිකරණය කිරීම.
- සෞඛ්‍ය අමාත්‍යාංශය සමග සම්බන්ධිකරණය කිරිමෙන් වෛද්‍ය පරීක්ෂණ සඳහා වෙලාවක් වෙන්කරවා ගැනිමට පහසුකම් සපයා දිම.

## වැදගත් උපදෙස්.
## ඔබගේ රටින් පිටවීමට පෙර;

1. LMRA වෙබ් අඩවිය http://portal.lmra.bh/english/express_services මගින් ඔබගේ වීසා අංකය නියමිත ස්ථානයට ඇතුලත් කිරීමෙන් ඔබගේ සේවා වීසාවෙහි වලංගුතාවය පරීක්ෂා කරන්න.
   - ඔබ මීට පෙර බහරේන්හි සේවයකර ඇත්නම් වීසා අයදුම් කිරීමට ප්‍රථම කරුණාකර ඔබගේ පැරණි හැඳුනුම්පත ඔබගේ සේව්‍යයා වෙත ලබාදෙන්න.
2. පහත ලියකියවිලි ඔබ සමගදැයි සනාථ කරගන්න.
   - ඔබගේ ගුවන් ගමන් බලපත්‍රයේ ඡායාපිටපත් 02 ක්. (එය මාස හයකට වඩා වලංගු කාලයකින් යුක්ත විය යුතුය.)
   - LMRA සේවා වීසා ලියවිල්ලෙහි ඡායා පිටපතක්.
   - ඔබගේ සේවා කොන්ත්‍රත්තුව ඇතුලත් ලියවිල්ල.
   - රියදුරු බලපත්‍රය. (ඇත්නම් )
   - උපාධි සහ සුදුසුකම් වලට අදාළ සහතික.(ඇත්නම් )
   - ඔබ විවාහක නම් , විවාහ සහතිකයේ ඡායා පිටපතක් සහ රැගෙන ඒමට අපේක්ෂා කරන දරුවන් පිලිබඳ විස්තර.




3. කරුණාකර පහත වෙබ් අඩවිය මගින් ඔබගේ රටේ ලැයිස්තු ගත අනුමත සෞඛ්‍ය මද්‍යස්ථානයකින් පමණක් සෞඛ්‍ය තත්වය පරීක්ෂා කර වාර්තාවක් ලබාගන්න. අනුමත ලැයිස්තුව http://portal.lmra.bh/english/clinics/index මගින් ලබාගත හැක.

## ඔබ බහරේන් රාජ්‍යයට පැමිණි පසු ;

LMRA කවුන්ටරය වෙත ගෙනයාමට ඔබගේ වීසා බලපත්‍රයේ සහ ගුවන් ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක් සූදානම් කරගන්න.

LMRA කවුන්ටරය මගින්; ඔබ ඔබගේ හැඳුනුම්පත, නැවතුම් බලපත්‍රය ලබාගැනීමට, වෛද්‍ය පරීක්ෂණ සඳහා නියමිත වේලාවක් ලබාගැනීමට අදාළ පුද්ගලයින් සමග සම්බන්ධීකරණය කරනු ඇත.

ඔබ මෙ රටට ඇතුළු වූ පළමු අවස්ථාවේදී ඔබගේ ඇඟිලි සලකුණ, ඔබගේ ඡායාරූපය සහ ඔබගේ අත්සන LMRA කවුන්ටරය වෙත ලබාදීමට සිදුවෙනු ඇත.

එසේ කිරිමට ගුවන් තොටුපලේදි නොහැකිවුයේ නම් පැමිණ මාසයක් ඇතුලත L M R A මුලස්ථානයෙන් ඒ පිළිබඳව සොයා බැලීමට සිදුවෙනු ඇත.

ඔබ ස්ථාන මාරුවක් ලබාගැනිමට අදහස් කර ඇති විටක ස්ථානමාරු අයදුම්පත සහ ඔබගේ හැඳුනුම්පතේ පිටපතක් සමග අමුණා භාර දිය යුතු වේ.

ඔබගේ ගුවන් ගමන් බලපත්‍රය ඔබ සතුවම තබාගතයුතු අතර එය අන්සතු කිරීම නොකළ යුතුය. එසේ නැතහොත් ඔබගේ සම්පූර්ණ අනුමැතිය හා එකඟතාවය මත ඔබගේ සේව්‍යයා භාරයේ එය තැබිය හැකිය.

**වැදගත් නිවේදනයයි.**
මොනයම් හේතුවක් මත ඔබගේ පවුලේ සාමාජිකයින් ඔබ සමග හෝ වෙන්වෙන්ව මෙරටට ගෙන්වා ගන්නා විට එම සැම පවුලේ සාමාජිකයකුට ම වෙනම විදේශ ගමන් බලපත්‍ර තිබිය යුතු වේ.

## බහරේන් රාජ්‍යයට පැමිණීමෙන් පසු;

දඬුවමකට යටත් වීමකින් හෝ මොනයම් ආකාරයක නීතිමය තත්වයකදී හෝ ඔබගේ සේවා වීසා අවලංගු වීමක් මග හැරීම ට ඔබගේ නිරවද්‍යතාවය තහවුරු කරගන්නා තෙක් බහරේන් රාජ්‍යයෙහි නීත්‍යානුකූලව රැඳීසිටීමට කරුණාකර පහත පිළිවෙල අනුගමනය කරන්න.

1. ඔබේ සේවා විසාවේ සදහන්ව ඇති රැකියාවේ පමණක් නිරත විය යුතුය.
2. ඔබගේ සේවා වීසාවෙහි යම් නිශ්චිත ස්ථානයක් සඳහන් කර ඇත්නම් හෝ එම සේව්‍යයා සතුව එහි වෙනත් ශාඛාවන් ඇත්නම් එම ශාඛාවන්හි ඒ සමාන රැකියාවක නිරතවිය හැකිය.
3. L M RA සෝදිසි කිරීමේ නිලධාරීන් ඔබගේ ලියවිලි හෝ ඇඟිලි සළකුණු පිළිබද නිරවද්‍යතාවය තහවුරු කරගන්නා විට ඒ සදහා ඔබගේ සහයෝගය ලබා දෙන්න.
4. ඔබගේ සේවා ගිවිසුමෙහි අඩංගු නීති සමග ඔබ බැදීපවතයි.
5. සේව්‍යයා මගින් අලුතින් ඉල්ලීමක් කරන තෙක් ඔබගේ වීසා අළුත්කිරීම වැලැක්වෙනු ඇත.
6. වෙනත් ස්වාමිත්වයක් යටතට සේවය මාරු කිරීමේදී හෝ ඔබගේ සේවා වීසා අලුත්කිරීමකදී හෝ නැවත සේවා වීසා ලබාගැනීමේදී කිසිදු ගාස්තුවක් නොගෙවිය යුතුය.
7. රටෙහි සංස්කෘතියට, ජාතිකත්වයට ගරු කිරීම සහ බහරේන් රාජ්‍යයේ සියළු නීතීන්ට යටත් වීමට පොරොන්දු විය යුතුය.
8. වෙනත් නීතිමය කරුණක් මත හෝ සේව්‍යයාගේ අනුදැනුමකින් තොරව එකදිගට දින 15 කට වඩා සේවාවට නොපැමිණීම නොකළ යුතුය.
9. ඔබගේ සේව්‍යයා සමග යම්කිසි අර්බුධකාරී තත්වයක් මතුවූ අවස්ථාවකදී කරුණාකර මුස්ලිම් නීතිය සහ අධිකරන සේවා අමාත්‍යාංශයේ කම්කරු අධිකරණය ( Labour courts) වෙත යොමුවිය යුතුය.
10. ඕනෑම වේලාවකදි ඔබගේ ජංගම දුරකථනයෙන් මගින් කෙටි පණිවිඩයක් බැටෙල්කෝ ( Batelco ) අංක 90168 වෙත හෝ සෙයින් ( Zain ) අංක 77070වෙත, හෝ විවා අංක 98690 ඔබගේ හැඳුනුම්පත් අංකය ( CPR xxx xxx xxx ) සමග යොමුකිරීම මගින් ඔබගේ සේවා වීසා බලපත්‍රයෙහි තත්වය පරීක්ෂා කරගැනීමට පුළුවන.

## විගමනික දොරටුව

ඔබට මෙම සේවාව භාවිතා කර ඕනෑම වේලාවකදී ඔබගේ සේවා වීසා තොරතුරු සහ ඔබගේ පවුලේ තොරතුරු සහ අවශ්‍ය වෙනත් තොරතුරු පරීක්ෂා කරගත හැකිය.

මෙම සේවාවට ප්‍රවේශ වීමේදී ඔබගේ හැඳුනුම්පත් අංකය ( CPR ) සහ ඔබගේ ගුවන් ගමන් බලපත්‍රයේ කල් ඉකුත් වන දිනය ලබාදිය යුතුය.https://www.lmra.bh/expatportal/login.php



බහරේන් රාජ්‍යයට පැමිණ දින 30 ක් ඇතුලත ඔබගේ සෞඛ්‍ය පරීක්ෂණ වාර්තාව සම්පූර්ණ කරගත යුතුය

## වෙනත් සේව්‍යයකු වෙත මාරුවීම.

LMRA ව්‍යවස්ථාමය කොන්දේසි සහිත 2009 අංක 79 දරණ පණතෙහි සේවකයෙකු නිවැරදිව වෙනත් සේව්‍යයකු වෙත මාරුකිරීම පිළිබඳව මෙසේ දැක්වේ;

### 1- සේව්‍යයාගේ එකඟතාවය රහිතව මාරුකිරීම.

- වත්මන් සේව්‍යයා සමග එක් අවුරුදු කාලසීමාවක් සම්පූර්ණ කළ පසුව ස්ථානමාරු ක්‍රියාවලිය ආරම්භ කළ යුතුය.
- මාරුවීමක් අපේක්ෂා කරන විටෙකදී එකී දැනුම්දීමේ ලිපිය තැපැල් ස්ථානයක් මගින් ලියාපදිංචි තැපෑලෙන් යොමුකොට එහි රිසිට්පත වත්මන් සේව්‍යයා වෙත ඉහත සමාන ආකාරයෙන් ලබාදිය යුතු වන අතර එය ඉහත දැනුම්දීමෙන් මාස 03ක කාලයක් නොඉක්මවිය යුතුය.
- මාරුවීමක් අපේක්ෂාවෙන් අළුත් සේව්‍යයෙකු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවකදී LMRA ව්‍යවස්ථාව අනුගමනය කළ යුතුවේ.

### 2- සේව්‍යයාගේ කැමැත්ත ඇතිව ස්ථානමාරු වීම.

- සේවකයෙකු සඳහා LMRA වෙත කරනු ලබන සියලුම ඉල්ලීම් පළමු සේව්‍යයා සමග සම්බන්ධීකරණය වීම මගින් දෙවන සේව්‍යයා විසින් ඉදිරිපත් කළයුතු වේ.
- LMRA ක්‍රමයට අනුව පළමු සේව්‍යයා විසින් සේවකයාහට මාරුවීම සඳහා එකඟතාවය පළකර ඇති විටෙක, මාරුවීම සඳහා අදාළ වියදම් දෙවන සේව්‍යයා විසින් දැරියයුතු වේ.

### 3- සේවා වීසා අවසන්වීම හෝ වෙනත් හේතූන් මත මාරුවීම සඳහා කිසියම් ගැටළුවක් ඇතිවූ විටෙක,

- ඔබගේ දැනුමට අනුව සේවා වීසා අවසන් වීමට දින 30කට පළමුව හෝ දින 05ක කාලයක් තිබියදී LMRA වෙත පුද්ගලිකව පැමිණ විමසීමක් කළයුතු වේ.
- දින 30 ක කාලයක් රැකියා මාරැවිමක් සදහා ඔබ වෙත ලබා දෙනු ඇත.

**අපව සම්බන්ධකර ගැනීමට**

විගමනික දොරටුව මගින් LMRA සමග සම්බන්ධීකරණය වීම සඳහා ඔබ විසින් ඔබගේ ජංගම දුරකථන අංකය ඇතුළත්කර විද්‍යුත් තැපැල ( e- mail ) මගින්; https://www.lmra.bh/expatportal/login.php නැතහොත් LMRA හි සේවාදායක / පාරිභෝගික සේවාව වෙත දුරකථන අංක 17506055 මගින් ඇමතීමෙන් හෝ ඔබගේ තානාපති කාර්යාලයෙන් හෝ විමසීමක් කරන්න.

LMRA සේවාව ලබාගැනීමට හෝ ඔබගේ LMRA කොන්දේසි පරීක්ෂාකර බැලීමට; http://portal.lmra.bh/english/page/show/105 භාවිතා කරන්න.

වැඩිදුර විස්තර සඳහා 17506055 අංකයට අමතන්න. නොඑසේනම් අපගේ www.lmra.bh වෙබ් අඩවියට පිවිසෙන්න.